**ශීර්ෂය 114 - ප්‍රවාහන අමාත්‍යාංශය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ප්‍රවාහන අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ප්‍රවාහන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජුනි 28 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 සැප්තැම්බර් 24 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ප්‍රවාහන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම.

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට තහවුරු කිරිමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින්

සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛණ සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදකවූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශ ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) පසුගිය වර්ෂයේ ප්‍රවාහන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබූ

නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

**1.6.1 මූලධන වියදම්**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| කොළඹ තදාසන්න දුම්රිය කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ආසියානු සංවර්ධන බැංකුව විසින් සිදුකළ සෘජු ගෙවීම් හේතුවෙන් ප්‍රවාහන අමාත්‍යාංශයේ හා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශ අතර සමාලෝචිත වර්ෂය තුල ආසියානු සංවර්ධන බැංකු මූල්‍යායනයට අදාලව රු.147,278,993 ක වෙනසක් නිරීක්ෂණය විය | දෝෂයක් හෝ වරදක් නොවන අතර 2020 වර්ෂය අවසානයේ ආසියානු බැංකු සෘජු ගෙවීම් (**Direct Payment)** භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව එම වසර සඳහා ගිණුම්ගත කර නොතිබීම හා 2019 වර්ෂය අවසානයේදී ව්‍යාපෘතිය විසින් සිදු කරන ලද සෘජු ගෙවීම් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් 2020 වර්ෂය සඳහා ගිණුම් ගත කිරීම සිදු වී ඇත. | මූල්‍ය ප්‍රකාශ පිලියෙල කිරීමේදී ව්‍යාපෘති කාර්යාලය විසින් තම රේඛීය අමාත්‍යාංශය සමග මූල්‍ය වර්ෂය අවසාන දිනට වියදම් හා ණය වාර්තා පිලිබද සැසදීමක් කල යුතු වීම |

**1.6.2 අග්‍රිම ශේෂය**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| ගිණුම් සමග ඉදිරිපත් කර තිබූ අග්‍රිම සැසදීම් ගිණුමේ වෙනත් දෙපාර්මේන්තු විසින් කල වියදම් රු.7,443,654 ක් ලෙස දක්වා තිබූ අතර විගණනය වෙත | අමාත්‍යාංශය විසින් වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරණ ලද වියදම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඇතුලත් වන නමුත් මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයට ඇතුලත්ව නොමැත.එම | වෙනත් දෙපාර්තමේන්තු විසින් කළ වියදම් සැසඳුම් ප්‍රකාශයේ පැහැදිලිව හදුනාගත හැකිවන පරිදි අනාවරණය කල යුතු වීම. |

| | |
|---|---|
| ඉදිරිපත් කල තොරතුරු අනුව එම අගය රු.8,880,369,033 ක් වීම හේතුවෙන් රු.1,436,713,269 කින් නොසැසඳුණි. | නිසා මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය ගැලපීම මත ලැබී ඇති අතිරික්ත අගයයන් අක්මුදල් ගැලපීම් ගිණුමට ඇතුලත් කර ඇත. |

**2. මූල්‍ය සමාලෝචනය.**

---------------------

**2.1 වියදම් කළමනාකරණය.**

---------------------------

| විගණන නිරික්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------- | ------------ | ------------------ |
| (අ) | වැය විෂයයන් 06 ක සම්පූර්ණ ප්‍රතිපාදනය වූ රු.2,800,000ක් ඉතිරි වී තිබුණි. | රජය විසින් ක්‍රියාත්මක කර ඇති ප්‍රතිපත්තිමය තීරණය අනුව මූලධන වියදම් පාලනය කිරීම නිසා එම වැය විෂයන් වල ප්‍රතිපාදන ඉතිරිවීම් සිදුව ඇත. | අවශ්‍යතා නිසි පරිදි හඳුනාගෙන අයවැය ඇස්තමේන්තු සකස් කලයුතු වීම |
| (ආ) | වැයවිෂයයන් 08 ශුද්ධ ප්‍රතිපාදනයරු. 3,709,793,000 ක් වූ අතර ඉන් රු. 955,590,783 ක් ඉතිරි වී තිබුණි. එහි ඉතිරිය සියයට 08 සිට සියයට 89 ක පරාසයක් අතර පැවතුණි. | 2020 වසර තුලදී අතුරු සම්මත ගිණුම් 04 ක් යටතේ ලද ප්‍රතිපාදන වලින් පුනරාවර්තන වියදම් දැරීමෙන් පසු ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන ක්‍රියාවලින් සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ බැවින් එම වසර තුළ ප්‍රසම්පාදන ක්‍රියාවලින් සම්පූර්ණයෙන්ම නවතා දැමීමට සිදුවිය. තවද සේවකයින් ඉවත්වීම,බඳවා ගැනීම් ප්‍රමාද වීම,සැලසුම් කල වැඩසටහන් ඉටු නොකිරීම,ගෙවීම් කිරීමට | ඉතිරිවීම් සඳහා ආසන්නතම හේතු මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කලයුතුවීම. |

| | | | |
|---|---|---|---|
| | | කැබිනට් අනුමැතිය ලබාගැනීම ප්‍රමාද වීම,අවසන් බිල්පත් නොලැබීම සහ කොවිඩ් වසංගත තත්ත්වය වැනි කරුණු හේතුවෙන් කාර්යය ඉටු කිරීමට නොහැකි වීම මත ඉතිරි විය. | |
| **(ඇ)** | කොළඹ නගරාශ්‍රිත දුම්රිය කාර්යත්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂය තුල රු. 2,207,209,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද ,ඉන් රු. 414,873,553 ක් පමණක් වැය කිරීම හේතුවෙන් ප්‍රතිපාදනවල රු. 1,792,335,447 ක ඌන උපයෝජනයක් නිරීක්ෂණය විය. | 2019 වර්ෂයේ අගෝස්තු මාසයේදී ආසියානු සංවර්ධන බැංකුව විසින් REIP සඳහා ගිවිසුම් අත්සන් කරන ලද අතර 2020.07.15 කැබිනට් අනුමැතිය ලැබුණි.එහෙත් 2020 ජුලි මස සිට මහා භාණ්ඩාගාරය විසින් පත් කරන ලද ව්‍යාපෘති ඇගයීමේ කමිටුව විසින් ව්‍යාපෘති ඇගයීමට පත් කිරීම සහ මහා භාණ්ඩාගාර ලේකම්ගේ අංක ERD/IRCPRS/GEN/10 සහ 08 ජුලි 2020 දිනැති චක්‍ර ලේඛයේ උපදෙස් මත සියලු කොන්ත්‍රාත් ප්‍රදානයන් සහ ගිවිසුම් අත්සන් කිරීම් අත්හිටුවීම සිදු විය.ඒ හේතුව නිසාම ටෙන්ඩර් කමිටු රැස්වීම්ද නොපැවැත්වුණි.මේ නිසා ප්‍රධාන ඉදිකිරීම් කොන්ත්‍රාත් 02 හි ප්‍රසම්පාදන ක්‍රියාවලිය නියමිත කාලය තුල අවසන් කර ගත නොහැකි විය. | ආසියානු සංවර්ධන බැංකු ණය මුදල් නොපමාව කාර්යක්ෂමව අදාල කාර්යය සඳහා යෙදවිය යුතුවීම. |

**2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම.**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 ජනවාරි මස 07 වන දිනැති අංක CP20/2095/312/025 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සපයනු ලබන උපදේශන සේවා සඳහා වූ කාලසීමාව දීර්ඝ කර ඒ සඳහා ගෙවිය යුතු අතිරේක වියදම් ලෙස රු. 25,865,000 ක් අනුමත කර තිබුණද, මෙම බැරකම, බැරකම් පිළිබඳ ප්‍රකාශනයෙහි - (i) (සටහන (iv) රු. 25,000,000 ක් ලෙස දක්වා තිබුණි.එම නිසා මුළු බැරකම් රු. 865,000 ක් අඩුවෙන් බැරකම් පිළිබඳ ප්‍රකාශයෙහි දක්වා තිබුණි. | අතපසුවීමකින් ගිණුම් යාවත්කාලීන කිරීම සඳහා එම අගය ලබා දීමට නොහැකි විය. ගිණුමේ දක්වා ඇති රු.මිලියන 25 ට අමතරව තවදුරටත් රු.865,000+**vat** මුදලක් බැරකම් ලෙස ඇතුලත් විය යුතුය. | නිශ්චිත පරිදි බැරකම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශ පිළියෙල කලයුතු වීම. |

**2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය.**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් 03 දෙනෙකුගෙන් වර්ෂ 05 කට වැඩි කාලයක් තිස්සේ අය නොවී පැවති රු. 398,702 ක ණය ශේෂයක් අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි. | කඩිනමින් හිග ණය ශේෂ අයකර ගැනීමට පියවර ගෙන ඇත. | හිග ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කලයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) 2012 වර්ෂයේදී වැඩ තහනමට ලක් වී සිටි නිළධාරියකුගෙන් අයවීමට පැවති රු. 121,945 ක ණය ශේෂය අයවී නොතිබුණි. | -එම- | -එම- |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

---------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| ------------------------- | ------------- | --------------------- | ------------- |
| **<u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහ</u>** | | | |
| මුදල් රෙගුලාසි අංක 104 (3) හා (4) වගන්ති. | වාහන අනතුරු 06කට අදාලව මුදල් රෙගුලාසි 104(3) ප්‍රකාරව පරීක්ෂණ කටයුතු නිම නොකිරීම හේතුවෙන් එම විස්තර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. ඉකුත් වර්ෂ හතක් තුළ වාහන 8 ක් සඳහා අයවිය යුතු රු.368,819 ක් ,හානියට වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු සිදුකරමින් පැවතියදී මූල්‍ය ප්‍රකාශනයෙන් කපා හල ශේෂ ලෙස දක්වා තිබුණි. තවද නියමිත වෙලාවට අදාල වාර්තා නිකුත් නොකිරීම | ප්‍රවාහන විෂය අයත් අමාත්‍යාංශය අවස්ථා කිහිපයකදී වෙනත් අමාත්‍යාංශ සමඟ ඒකාබද්ධ වීම ,නැවත වෙන්වීම ආදී හේතුන් මත 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වාම නියමිත රෙගුලාසි වලට අනුව කාර්යයන් සිදු වී නොතිබුණි.<br><br>මේ හේතුවෙන් 2016 වර්ෂයේ සිට ඉදිරියට වූ වර්ෂ | මුදල් රෙගුලාසි හා ලැබී ඇති අනුමැතිය ප්‍රකාරව කටයුතු කලයුතු වීම. |

| | |
|---|---|
| නිසා 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වූ පාඩු හා හානි සම්බන්ධව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම ප්‍රමාද වී තිබුණි. | වලදී සිදු වී ඇති වාහන අනතුරු සම්බන්ධයෙන් නියමිත රෙගුලාසි වලට අනුව කටයුතු කිරීමේදී බාධාවන් සිදුවී ඇති බව සඳහන් කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය.

### 3.1 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්.

**(අ) කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියට අදාල අනවසර පදිංචිකරුවන් නැවත පදිංචි කරවීම හා ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධව 2020 අවසාන වන විට නිවාස ඒකක 2,036 ක නැවත පදිංචි කිරීමට සැලැසුම් සකස් කළද, නිවාස ඒකක 386 ක පමණක් නැවත පදිංචි කිරීම් සිදුකර තිබුණි. තවද, ඉඩම් අත්පත් කර ගැනීමේ ආඥාපනතේ 04 වන වගන්තිය යටතේ ඉඩම් කට්ටි 454 ක් සඳහා ආඥාපත් නිකුත් කර තිබුනද ඉන් 05 වන වගන්තිය යටතේ ආඥාවන් නිකුත් කර තිබුනේ ඉඩම් කට්ටි 02 ක් සඳහා පමණි. ඒ අතරම අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි 2020 අවසාන වන විට අනවසර පදිංචිකරුවන් | නාගරික සංවර්ධන අධිකාරිය ලබා දුන් නිවාස ඒකක 454 හි පවුල් 220 ක් මේ වන විට පදිංචි කර අවසන්ව ඇත.තවත් පවුල් 32 ක් මෙම අසීරු කාලසීමාවෙන් පසුව පදිංචි කරනු ඇත.කොළඹගේ මාවත සහ කාලිංග මාවත නිවාස ඉදි කර අවසන් වීම අනුව 2021 වසරේදී පවුල් 471 ක් පදිංචි කිරීමට සූදානම්ව ඇත.මේ අනුව භාණ්ඩාගාර මුදල් ලබාදීම,නාගරික සංවර්ධන අධිකාරියේ නිවාස ඉදි කිරීමේ සහ ව්‍යාපෘතියේ පවුල් නැවත පදිංචි කිරීම් සමගාමී ස්වරූපයෙන් ක්‍රියාත්මකය.<br>අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබුනු මුළු මුදල මේ වන තෙක් | අයවැය ප්‍රතිපාදන නිසිපරිදි කාර්යක්ෂමව අදාල කාර්යය සඳහා යෙදවීමට කටයුතු කලයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | නැවත පදිංචි කර අවසන් කළ යුතු වුවද, එසේ කර නොතිබුණි. | මුළුමනින්ම ලබාදී අවසන්ව නැත. 2021 වසර සඳහාද රු.මි.1525 ක් වෙන් කර ඇත.ඉන්පසු ඉතිරිවන අරමුදල්ද 2022 වසරේදී ලබාගැනීමට අපේක්ෂා කෙරේ.කැළණිය පැරණි දුම්රිය පාලම,නැවත ඉදිකිරීමේදී පවුල් 25 කට ආසන්න ප්‍රමාණයක් නැවත පදිංචි කිරීම සඳහා මෙම අරමුදල්ම භාවිතය සඳහා 2021 (2021.01.19 දිනැති අමප/20/2003/312/023) වසරේ ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිවී ඇත. | |
| (ii) | කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය මගින් සැලැසුම් කළ ශක්‍යතා අධ්‍යයන වාර්තා කාලානුරූපීව උපදේශන(Dhowa) සමාගම විසින් ව්‍යාපෘතිය වෙත ලබාදිය යුතු වුවත් කාල ප්‍රමාදයකින් ව්‍යාපෘති වාර්තා ලබා දී තිබූ අතර කෙටුම්පත් අවසන් වාර්තා 03 ක් හා අවසන් වාර්තාව සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.<br>. | සවිස්තරාත්මක කරුණු ආසියානු සංවර්ධන බැංකුවට සහ ප්‍රවාහන අමාත්‍යාංශයට ඉදිරිපත් කොට 2021 ජනවාරි සිට 2021 අප්‍රේල් දක්වා කාලය ලබාදී (අමතර වියදම් රහිත කාලය දිගු කිරීමක්) අවසන් වාර්තා සියල්ල ලබා ගන්නා ලදී. | ගිවිසුම් ගත වී ඇති පරිදි වාර්තා ඉදිරිපත් කලයුතු වීම. |

**(ආ) කුරුණෑගල හබරණ හරහා දුම්රිය මාර්ගය - ව්‍යාපෘතිය.**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | -------------------------- | --------------------- |
| කුරුණෑගල හබරණ දුම්රිය ව්‍යාපෘතිය යටතේ 2010 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලය තුල දේශීය අරමුදල් මූල්‍යකරණය | ව්‍යාපෘතිය සක්‍රිය කටයුතු ආරම්භ කරන ලද්දේ 2016 වර්ෂයේ වන අතර එහිදී ජල විද්‍යාත්මක | ව්‍යාපෘතිය කාර්යක්ෂමව ඉටුකල යුතු සේම ඇස්තමේන්තු ඌන |

| | | |
|---|---|---|
| යටතේ වාර්ෂික ඇස්තමේන්තු මගින් රු. 1,332,757,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද කාලසීමාව තුල එම මුදලින් රු.144,433,309 ක් එනම් සමස්ත ප්‍රතිපාදනවලින් සියයට 13.08 ක් පමණක් වැයකර තිබුණි. | අධ්‍යයනය සහ පස් පරීක්ෂා කිරීමේ කටයුතු සඳහා ප්‍රතිපාදන වෙන් වුවද,රජයට වැය බරක් නොවන ලෙස එම කාර්යයන් බැඳීමකින් තොරව විදේශීය සමාගමක් මඟින් ඉටු කිරීම නිසා ප්‍රතිපාදන ඉතිරියක් විය.<br>ඉඩම් පවරා ගැනීම් කටයුතු 2018 වර්ෂයේ ආරම්භ කල අතර වන්දි ගෙවීම් කටයුතු සඳහා වන්දි පරීක්ෂණ පැවැත්වීමට 2020 වර්ෂයේ කොවිඩ් වසංගත තත්ත්වය නිසා ඉටු කිරීමට නොහැකි විය. | උපයෝජනය අවම කරගත යුතුවීම. |

## 3.2 වත්කම් කළමනාකරණය.

----------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ---------------------------- | ------------ |
| භාණ්ඩ සමීක්ෂණයේ දී ඇති වූ ඌනතා සහ අතිරික්ත සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් විසින් කරුණු පැහැදිලි කරගෙන ඉදිරි පියවර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ සම්බන්ධව ද පියවර ගෙන නොතිබුණි | ඌනතාවන් සහ අතිරික්ත සම්බන්ධ මේවන විට විමසීම් සිදුකර ඒ සඳහා පිළිතුරු ලබාගෙන ඇති අතර ඒ අනුව නිවැරදි කිරීම් සිදුකර ඇත. ඇති වූ කොවිඩ් -19 තත්ත්වය මත වෙන්දේසි කටයුතු මදක් ප්‍රමාද වුවද හැකි ඉක්මනින් අපහරණය කිරීමට කටයුතු කරමි. . | මුදල් රෙගුලාසි හා ලැබී ඇති අනුමැතිය ප්‍රකාරව කටයුතු කලයුතු සේම වත්කම් වල ආරක්ෂාව සැලසීමට අවශ්‍ය පියවර ගත වීම. |

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) කොළඹ නගරාශ්‍රිත දුම්රිය කාර්යත්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂය තුල ප්‍රයාපන ගාස්තු ලෙස රු. 34,353,893 ක් ආසියානු සංවර්ධන බැංකුවට ගෙවීමට සිදු වී තිබුණි. තවද ව්‍යාපෘතියේ මිළදී ගැනුම් සම්බන්ධයෙන් වූ කාර්යසාධනය ඇගයීමේදී 2020 වර්ෂය අවසන් වන විට ආරම්භ කළ හැකි වී තිබුණේ දීප ව්‍යාප්ත සන්නිවේදන ව්‍යාපෘතිය පමණි. | වෘත්තීය සමිති විසින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමට විරුද්ධ වීම, අමාත්‍යාංශය වෙනස්වන කාලය තුල ඇති වූ ප්‍රමාදය .කොවිඩ් 19 නිසා ඇති වූ ප්‍රමාදය සහ රජය විසින් මාස 5 ක කාලයකට පමණ ගිවිසුම් අත්සන් කිරීම චක්‍ර ලේඛයක් මඟින් නවතාලීම යන ව්‍යාපෘතියෙන් පරිබාහිර හේතු නිසා ප්‍රයාපන ගාස්තු ලෙස රු.34,455,893 ඇරීමට සිදුවතිබුණි. | අරමුදල් නිසි කළමණාකරනය කිරීම තුලින් ප්‍රයාපන ගාස්තු ගෙවීම අවම කරගතයුතු වීම. |

## 4. තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තිරසාර සංවර්ධන ඉලක්ක කරා ළඟාවීම සඳහා අමාත්‍යාංශය විසින් අදාළ ඉලක්කයන් හඳුනාගැනීමට හා ඒවා මැනීමට අවශ්‍ය නිර්ණායක හඳුනාගැනීමට නිවැරදි දත්ත පදනමක් පැවතීම අත්‍යාවශ්‍ය වුවත්, ආයතනය විසින් තිරසර සංවර්ධන ඉලක්කයන්ට ළඟා වීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහිකර ගැනීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | අමාත්‍යාංශය මගින් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක නොකරන අතර අනුබද්ධිත ආයතන මගින් සිදුකරන සංවර්ධන වැඩසටහන් නියාමනය, අධීක්ෂණය සහ ප්‍රගති සමාලෝචනය සිදු කරනු ලබයි. එම නිසා අමාත්‍යාංශය සඳහා සකසන ලද ක්‍රියාත්මක සැලැස්මේ තිරසාර සංවර්ධන ඉලක්ක සඳහන් කර නොමැති අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක | තිරසාර සංවර්ධන ඉලක්ක හඳුනා ගැනීම හා ඊට අදාල නිර්නායක හඳුනාගෙන සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කලයුතු වීම හා ඊට අදාල දත්ත පදනමක් ඇතිකර ගතයුතු වීම. |

කරන අමාත්‍යාංශයේ අනුබද්ධිත ආයතන සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ව්‍යාපෘති කාර්යාල මගින් සකස් කර ඇති ක්‍රියාත්මක සැලැස්මේ අදාල තිරසාර සංවර්ධන ඉලක්කයන් සඳහන් කර ඇතත් අදාළ නිර්නායකයන් හඳුනා ගෙන නැත. 2021- ක්‍රියාත්මක සැලැස්ම සකස් කිරීමේදී, ඉහත අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කර ඇති අතර කාර්ය සාධන දර්ශක (key performance indicators ) ඇතුලත් කර ඇත.